ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථානුකූලව ගුරුවරුන්ගේ

කාර්යක්ෂමතාව සඳහා වූ මොඩියුල ක්‍රියාත්මක කිරීම

# 10

# මොඩියුලය

# විෂය සමගාමී ක්‍රියාකාරකම් හා පාසල් ව්‍යාපෘති

අධ්‍යාපන අමාත්‍යාංශය

ගුරු අධ්‍යාපන පරිපාලන ශාඛාව

# කෙටුම්පත - I

01. මොඩියුලයේ නම - විෂය සමගාමී ක්‍රියාකාරකම් හා පාසල් ව්‍යාපෘති

02. අරමුණ - ගුරුවරුන්ට පාසල තුළ ක්‍රියාත්මක කරනු ලබන විෂය සමගාමී කටයුතු පිළිබඳව පුළුල් දැනුමක් ලබා දීම.

03. අපේක්ෂිත ඵලය - පාසලේ ඇති සම්පත් උපරිම ලෙස ප්‍රයෝජන ගත හැකි පරිදි පාසල තුළ විෂය සමගාමී ක්‍රියාකාරකම් ක්‍රියාත්ම කිරීමට සූදානම් වූ ගුරුවරුන් පිරිසක් කිරීම හා ඒ තුළින් මහා පෞරුෂයකින් හෙබි දරු පරපුරක් බිහි කිරීම.

## 04. අන්තර්ගතය.

### 4.1 - හැඳින්වීම

පන්ති කාමරය තුළ ක්‍රියාත්මක වනවිධිමත්විෂය මාලාව මඟින් සිසුන්ගේ ශාස්ත්‍රීය දැනුම පමණක් ලබාදීමේ සම්ප්‍රදායක් බොහෝ පාසල්වල බිහිවෙමින් පවතී. හේතුව වන්නේ විභාගය ඉලක්ක කරගත් සමාජයක විභාග සමත්වීම පමණක්ම සිසුන් තුළ දෙමව්පියන් තුළ මෙන්ම සමස්ත ප්‍රජාව තුළද පෙළඹවීමක් ඇතිවී තිබීමය. න්‍යාය දැනුමත් ශාස්ත්‍රීය දැනුමත් සහිත පුද්ගලයින් පමණක් පාසලින් බිහිවීම මෙහි අවසන් ප්‍රතිපලය වන්නේය.

එම නිසා සිසුන් තුළ ප්‍රජනන ආවේදන, හා මනෝචාලක කුසලතා සමබර ලෙස වර්ධනය වීමට අවකාශ සැලසීම පාසල සතු විශාල වගකීමක් වන්නේය. මේ අනුව විධිමත් විෂය මාලාවෙහි දැනුම කුසලතා හා ආකල්ප වැඩසටහන් තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා පාසල විසින් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලබන නිරන්තර අධීක්ෂණයට භාජනය කරනු ලබන ක්‍රියාකාරකම් සමූහයක එකතුවක් ලෙස විෂය සමගාමී විෂය මාලාව හැඳින්විය හැක. මෙමගින් ශිෂ්‍යයාගේ දැනුම පමණක් නොව යහපත් ගති සිරිත් යහපත් ආකල්ප, උසස් කුසලතා හා පෞරුෂ ලක්ෂණ වර්ධනයක් සිදු කරනු ලබයි.

ශ්‍රී ලංකාවේ දැනට පවත්නා සම්පත් විෂමතාවය විෂය සමගාමී ක්‍රියාකාරකම් සැලසුම් කිරීමේදී විශේෂයෙන් සැලකිල්ලට ගත යුතුව ඇත. බොහෝ පාසල් මෙම තත්වය ඉස්මතු කරමින් විෂය සමගාමී ක්‍රියාකාරකම් ක්‍රියාත්මක නොකරයි. එම නිසා ඒ ඒ විද්‍යාලවලට සුවිශේෂී වන ආකාරයට විෂය සමගාමී ක්‍රියාකාරකම් සංවිධානය කිරීමට විදුහල්පතිවරුන් සහ ගුරුවරයා පෙළඹවිය යුතුය.

4.2 - **අනුමාතෘකා**

1. විෂය සමගාමී ක්‍රියාකාරකම් යන්න සරලව හඳුන්වාදීම
   i. විෂය සමගාමී ක්‍රියාකාරකම් නිර්වචනය කිරීම

2. පාසල් පද්ධතිය තුළ විෂය සමගාමී ක්‍රියාකාරකම් හඳුන්වා දීමේ දී අවශ්‍යතාවය
   i. පාසල තුළ ක්‍රියාත්මක වන විෂය සමගාමී ක්‍රියාකාරකම් ලැයිස්තු ගත කිරීම.
   ii. ඒවා වර්ගී කරනය කිරීම.

3. විෂය සමගාමී වැඩසටහන් ශ්‍රී ලංකාවේ පාසල්වල ක්‍රියාත්මක කිරීමේදී මතුවන ගැටලු හා බාධක හඳුනා ගැනීම.

4. විෂය සමගාමී වැඩසටහන් පාසලක් තුළ ක්‍රියාත්මක වීම සම්බන්ධව පාසල් අත්පත් කර ගන්නා වාසි හා අවාසි හඳුනා ගැනීම.

5. විෂය සමගාමී වැඩ සටහන් පාසලක් තුළ ක්‍රියාත්මක වීමේ දී සහභාගීත්වය කෙබදු ද?
   i. ශිෂ්‍ය සහභාගීත්වය ii. ගුරු මණ්ඩල සහභාගීත්වය

   මෙම සහභාගීත්වයන් උපරිම කර ගැනීමට පාසල්වලට ගත හැකි ක්‍රියාමාර්ග කවරේද සොයා බැලීම.

6. පාසලක් තුළ සැලසුම් සහගතව විෂය සමගාමී ක්‍රියාකාරකම් සංවිධානය කිරීම.

7. විෂය සමගාමී ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධව

   පහත සඳහන් භූමිකාවන්හි වැදගත් කම.

   1. විදුහල්පති 2. ගුරුවරයා 3. ශිෂ්‍යයා
   4. දෙමාපියන් 5. ආදි ශිෂ්‍යයන් 6. පොදු ප්‍රජාව

| අංකය | මාතෘකාව | අන්තර්ගතය | ගුණාත්මක යෙදවුම් / සම්පත් | ක්‍රමවේදය | කාලය |
| --- | --- | --- | --- | --- | --- |
| 01 | a) පාසලකට විෂය සමගාමී ක්‍රියාකාරකම් හඳුන්වා දීමේ අවශ්‍යතාවය.<br><br>b) පාසලක් තුල ක්‍රියාත්මක වන විෂය සමගාමී ක්‍රියාකාරකම් ලැයිස්තුගත කිරීම.<br><br>c) විෂය සමගාමී ක්‍රියාකාරකම් වර්ගීකරණය. | a) ★ විෂය සමගාමී නිර්වචනය කිරීම.<br>★ පාසලකට විෂය සමගාමී ක්‍රියාකාරකම් හඳුන්වා දීමේ අවශ්‍යතාවය පහදා දීම.<br>★ විෂය සමගාමී වැඩ සටහන් පාසල තුල ක්‍රියාත්මක වීම තුළින් බලාපොරොත්තු වන ආකල්ප කුසලතා හඳුනා ගැනීම.<br><br>b) ★ පාසලක් තුල සංවිධානය කළ හැකි විෂය සමගාමී ක්‍රියාකාරකම් පිලිබඳ අවබෝධය ලබා දීම.<br>★ පාසලේ පවතින මානව හා භෞතික සම්පත් අනුව පාසලට ගැලපෙන ආකාරයට එම ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය බව අවබෝධ කරවීම.<br><br>c) විෂය සමගාමී ක්‍රියාකාරකම් වර්ගීකරණය<br>a) පාසල තුල පමණක් ක්‍රියාත්මක වන<br>b) පාසල හා ප්‍රජාව සම්බන්ධිතව ක්‍රියාත්මක වන<br>c) පාසල හා රජයේ ආයතන සම්බන්ධව<br>d) පාසල හා රජයේ නොවන ආයතන සම්බන්ධව | ඩිමයි කොල<br>A 4 කොල<br>පාට A 4 කොල<br>ප්ලැටිග්නම්<br>සෙලෝටේප්<br>බහු මාධ්‍ය ප්‍රක්ෂේපන යන්ත්‍ර | ★ දේශන - සාකච්ඡා ක්‍රමය මගින් දේශන.<br><br>★ කණ්ඩායම් මගින් කරුණු ගෙන ඉදිරිපත් කිරීම. | පැය 04 |

| අංකය | මාතෘකාව | අන්තර්ගතය | ගුණාත්මක යෙදවුම් / සම්පත් | ක්‍රමවේදය | කාලය |
|---|---|---|---|---|---|
| 02 | a) විෂය සමගාමී වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී මතුවන ගැටලු හා බාධක.<br><br>b) විෂය සමගාමී වැඩසටහන් පාසලක් තුල ක්‍රියාත්මක කිරීමේදී සහභාගීත්වයන් කෙබඳුද ?<br>i. ශිෂ්‍ය සහභාගීත්වය<br>ii. ගුරුමණ්ඩලයේ සහභාගීත්වය<br><br>c) විෂය සමගාමී වැඩසටහන් මගින් පාසල් අත්පත් කර ගන්නා වාසි හා අවාසි පහදා දීම. | a) ★ විෂය සමගාමී වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී මතුවන ගැටලු පහත ලෙස ඉදිරිපත් කිරීම.<br>1) කළමණාකාරීත්වය තුලින් මතුවන ගැටලු.<br>2) ගුරුවරයා සම්බන්ධ ගැටලු.<br>3) ශිෂ්‍යයා සම්බන්ධ ගැටලු.<br>4) සමාජ ආර්ථික පසුබිමෙන් මතුවන ගැටලු.<br><br>b) විෂය සමගාමී වැඩසටහන් පාසල තුල ක්‍රියාත්මක කිරීමේදී, අදාල පාර්ශවයන්හි සහභාගීත්වය කෙබඳු විය යුතු දැයි සාකච්ඡා කිරීම. ඊට අදාල වන පාර්ශව හඳුනා ගැනීම.<br>★ ගුරු මණ්ඩලයේ සහභාගීත්වය හා සහාය කෙබඳු විය යුතුදැයි සාකච්ඡා කිරීම.<br>★ ශිෂ්‍ය සහභාගීත්වය කෙබඳු විය යුතුදැයි සාකච්ඡා කිරීම.<br>★ ගුරු මණ්ඩලයේ සහාය උපරිම කර ගැනීම සඳහා පාසලට ගත හැකි ක්‍රියාමාර්ග හඳුනා ගැනීම.<br>★ ශිෂ්‍ය සහභාගීත්වය උපරිම ලෙස වර්ධනය කර ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග හඳුනා ගැනීම.<br><br>c) විෂය සමගාමී වැඩසටහන් පාසලක් තුල ක්‍රියාත්මක වීමෙන් පාසල් අත්පත් කර ගන්නා වාසි<br>★ විෂය සමගාමී ක්‍රියාකාරකම් පාසල තුල නිසිලෙස සංවිධානය නොකිරීම තුල ඇතිවිය හැකි අහිතකර තත්වයන් සාකච්ඡා කිරීම. | ඩිමයි කොල<br>A 4 කොල<br>පාට A 4 කොල<br>ජ්ලැටිග්නම්<br>සෙලෝටේප්<br>බහු මාධ්‍ය ප්‍රක්ෂේපන යන්ත්‍ර | ★ දේශන - සාකච්ඡා ක්‍රමය මගින් දේශන.<br><br>★ කණ්ඩායම් මගින් කරුණු ගෙන ඉදිරිපත් කිරීම. | පැය 04 |

| අංකය | මාතෘකාව | අන්තර්ගතය | ගුණාත්මක යෙදවුම් / සම්පත් | ක්‍රමවේදය | කාලය |
|---|---|---|---|---|---|
| 03 | a) විෂය සමගාමී ක්‍රියාකාරකම් නිසා සංවර්ධනයවන ශිෂ්‍යයාගේ විවිධ අංග.<br><br>b) විෂය සමගාමී ක්‍රියාකාරකම් වලදී අවධානය යොමු විය යුතු කරුණු. | a) විවිධ විෂය සමගාමී ක්‍රියාකාරකම් නිසා ඇතිවන ශිෂ්‍ය සංවර්ධනයේ විවිධ අංග පහත ලෙස සාකාච්ඡා කිරීම.<br>1. ශාරීරිකව<br>2. බුද්ධිමය<br>3. සමාජීය හා සංස්කෘතික ලෙස<br>4. ආවේදනික හැකියා<br>5. සාරධර්ම අගයයන්<br><br>b) පාසලක් තුල විෂය සමගාමී ක්‍රියාකාරකම් සංවිධානයේදී අවධානය යොමු විය යුතු කරුණු මොනවාදැයි සාකච්ඡා කිරීම. | ඩිමයි කොල<br>A 4 කොල<br>පාට A 4 කොල<br>ජ්ලැටිග්නම්<br>සෙලෝටේප්<br>බහු මාධ්‍ය ප්‍රක්ෂේපන යන්ත්‍ර | ★ දේශනයක් මගින් අරමුණු පැහැදිලි කිරීම.<br><br>★ ගුරුවරුන් කණ්ඩායම් කර එක් එක් මාතෘකා දී කරුණු සාකච්ඡා කිරීම.<br><br>★ එක් එක් කණ්ඩායම් ඉදිරිපත් කිරීම<br><br>★ ව්‍යාපෘතීන් දේශන ක්‍රමයට භාවිතා කිරීම.<br><br>★ කණ්ඩායම් ක්‍රියාකාරකම් මගින් ව්‍යාපෘතීන් කිහිපයක් සැලසුම් කර වීම. | පැය 04 |

| | | | සම්පත් | | |
|---|---|---|---|---|---|
| 04 | a) විෂය සමගාමී ක්‍රියාකාරකම් සැලසුම් කරණය<br><br>b) පාසලක් තුල ක්‍රියාත්මක කල හැකි විශේෂ ව්‍යාපෘති | a) විෂය සමගාමී ක්‍රියාකාරකමක් සැලසුම් කිරීම තුලින් ලැබෙන ප්‍රතිලාභ සාකච්ඡා කිරීම.<br><br>b) පහත මාතෘකා යටතේ කණ්ඩායම් මගින් එක් එක් ක්‍රියාකාරකම් පාසලක සැලසුම් කිරීම සිදු කරන ආකාරය සාකච්ඡා කිරීම.<br>1) බිත්ති පුවත්පත්<br>2) උදෑසන රැස්වීම<br>3) ක්‍රීඩා පුහුණුව<br>4) ශීල ව්‍යාපාර සංවිධානය<br>5) පාසලේ වෙසක් උත්සවය<br>6) භක්ති ගීත වැඩ සටහන්<br>7) චිත්‍ර ප්‍රදර්ශන සංවිධානය<br>8) කොළ කැඳ ව්‍යාපෘති<br><br>c) පාසල තුල සිදු කල හැකි විශේෂ ව්‍යාපෘති<br>★ ව්‍යාපෘතියක් සිදු කිරීමේ අරමුණ හා එය සිදු කරන ආකාරය පිළිබඳ සරල අවබෝධය.<br>★ පාසලක් තුල සිදු කල හැකි ව්‍යාපෘතීන් හා විෂය සමගාමී ක්‍රියාකාරකම් අතර ඇති සම්බන්ධතාවය පැහැදිලි කිරීම.<br>පූර්ණ සමබර පෞරුෂ වර්ධනයට උපකාරී වීමට ව්‍යාපෘති පාදක අධ්‍යනය කිරීමේ වැදගත්කම පහදා දීම.<br>උදා. මගින්<br>1) අධ්‍යාපන චාරිකා හා ක්ෂේත්‍ර චාරිකා සංවිධානය<br>2) පාසලේ හා පිටත ඩෙංගු මර්ධන වැඩසටහන් සංවිධානය<br>3) ආගමික වැඩ සටහන්<br>4) නායකත්ව පුහුණු වැඩසටහන් | ඩිමයි කොල<br>A 4 කොල<br>පාට A 4 කොල<br>ප්ලැටිග්නම්<br>සෙලෝටේප්<br>බහු මාධ්‍ය ප්‍රක්ෂේපන යන්ත්‍ර | ★ දේශනයක් මගින් අරමුණු පැහැදිලි කිරීම.<br><br>★ ගුරුවරුන් කණ්ඩායම් කර එක් එක් මාතෘකා දී කරුණු සාකච්ඡා කිරීම.<br><br>★ එක් එක් කණ්ඩායම් ඉදිරිපත් කිරීම<br><br>★ ව්‍යාපෘතීන් දේශන ක්‍රමයට භාවිතා කිරීම.<br><br>★ කණ්ඩායම් ක්‍රියාකාරකම් මගින් ව්‍යාපෘතීන් කිහිපයක් සැලසුම් කර වීම | පැය 04 |

| [illegible] | [illegible] | [illegible] | [illegible] සම්පත් | [illegible] | [illegible] |
|---|---|---|---|---|---|
| 05 | විෂය සමගාමී ක්‍රියාකාරකම් පාසල් තුල සාර්ථකව ක්‍රියාත්මක කිරීමේදී වැදගත්වන පාර්ශවයන් හා ඔවුන්ගේ භූමිකාවල වැදගත්කම. | ★ විෂය සමගාමී ක්‍රියාකාරකම් සාර්ථකව පාසල තුල ක්‍රියාත්මක කිරීමට දායක විය හැකි ප්‍රධාන පාර්ශවයන් හඳුනා ගැනීම.<br>( විදුහල්පති, ගුරුවරයා, සිසුන්, දෙමව්පියන්, ආදි සිසුන් සහ පොදු ප්‍රජාව )<br><br>★ එක් එක් පාර්ශවයන් සතු විය යුතු නිපුණතා මාතෘකා පහත ලෙස හඳුනා ගැනීම.<br>( සංකල්පමය නිපුණතා, ආකල්පමය නිපුණතා, මානව නිපුණතා, තාක්ෂණික නිපුණතා )<br><br>★ විෂය සමගාමී ක්‍රියාකාරකම් සංවිධානයේදී ඉහත භූමිකාවන්හි වැදගත්කම හඳුනා ගැනීම.<br><br>උදා - 1. විදුහල්පති භූමිකාව<br>වැදගත්කම<br>සතුවිය යුතු නිපුණතා → සංකල්ප, ආකල්ප, මානව, තාක්ෂණික<br><br>2. ගුරු භූමිකාව<br>සතුවිය යුතු නිපුණතා → සංකල්ප, ආකල්ප, මානව, තාක්ෂණික | මුද්‍රිත අත් පත්‍රිකා<br>ඩිමයි කොල<br>A 4 කොල<br>පාට A 4 කොල<br>ප්ලැටිග්නම්<br>සෙලෝටේප්<br>බහු මාධ්‍ය ප්‍රක්ෂේපන යන්ත්‍ර | ★ දේශන ක්‍රමය කණ්ඩායම් මගින් කරුණු සාකච්ඡා කිරීම<br><br>★ වීඩියෝ දර්ශන ඉදිරිපත් කිරීම් මගින්.<br><br>★ සෑම ගුරුවරයකුටම අත්පත්‍රිකාවක් ලබා දීම<br><br>★ බහු මාධ්‍ය ඉදිරිපත් කිරීම් මගින්. | පැය 04 |
| | b) ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය තුල හඳුනාගන්නා ලද සංවර්ධිත විෂය සමගාමී ක්‍රියාවලින් හඳුනාගැනීම. | b) ලංකාවේ පාසල් තුල දැනට හඳුනාගෙන ඇති සංවර්ධිත විෂය සමගාමී ක්‍රියාවලින් හඳුනා ගැනීම සහ ගුරුවරුන්ට තමන්ගේ පාසල් තුල ආරම්භ කල හැකි විෂය සමගාමී ක්‍රියාකාරකම් හඳුනා ගැනීම. | | | |

**ඇගයීම (පැය ½)**

පහත සිද්ධිය කියවා මෙම පාසල තුළ සිදු කෙරෙන විෂය සමගාමී ක්‍රියා දහයක් (10) යටින් ඉරක් අඳින්න.

❖ **දෙනුවර විදුහල**

පමුදිත ගේ පියා පාසලට පැමිණියේ තම පුතාගේ පන්තියේ පැවැත්වෙන දෙමාපිය රැස්වීමට සහභාගී වීමටය.
පාසල අසලට පැමිණෙන විට උදෑසන රැස්වීම ආරම්භ වී පැවැතුණි. සීනු හඬට පෙළ ගැසුනු සිසුන් මුලින් ආගමානුකුල චාරිත්‍ර ඉටු කරන ලදී. ඉන්පසු ශරීර සුවතා සිදු කර පාසල් ගීතය ගායනා කර පේළියට තමන්ගේ පන්තිවලට යනු දුටු පමුදිතගේ පියාට මෙම පාසල පිළිබඳ යහපත් හැඟීමක් ඇති වුනි.
ශිෂ්‍ය නායකයින් නම් සහෝදර ශිෂ්‍යයන් හසුරවනු ලැබූ ආකාරය ඉතා යහපත්ය. උදෑසන ක්‍රීඩා පුහුණුවීම්වලට සහභාගී වී සිටි දරුවන් ද ලහි ලහියේ තමන්ගේ පන්ති කරා ඇදෙනු දක්නට ලැබිණි.
උදෑසන රැස්වීමෙන් අනතුරුව විද්‍යාලීය මාධ්‍ය ඒකකය විසින් නිවේදන නිකුත් කිරීම ආරම්භ කරන ලදී. එදින සවස පැවැත්වෙන කළා උළෙල සම්බන්ධව හා ශිෂ්‍ය සංගම් පිළිබඳව විශේෂ නිවේදනයන් කිහිපයක් ප්‍රචාරණය වෙනු ඇසුනි.දෙමව්පියන් පිරිස ද පාසලේ ගැවසෙනු දක්නට ලැබිනි. පමුදිතගේ පියා දුටුවේ ඔවුන් ඩෙංගු මර්දන වැඩසටහනට පැමිණි බවයි. සතියේ බදාදා දිනවල මෙවැනි ශ්‍රමදාන මෙම පාසලේ පැවැත්වේ.
පාසල් තූර්යවාදක කණ්ඩායමද උදෑසන පුහුණුවීම් අවසන් වී යනු දක්නට ලැබුණි. පමුදිත ද එම කණ්ඩායමේ සාමාජිකයෙක් බැවින් පියා තම පුතා සිටී දැයි විමසිල්ලෙන් බැලීය.
පන්ති රැස්වීමෙහි ආරම්භවීමට පෙර දෙමව්පියන් ගිය වසරේ පවත්වනු ලැබූ වාර්ෂික විවිධ ප්‍රසංගය පිළිබඳව ප්‍රසංසා මුඛයෙන් කථා කරනු පමුදිතගේ පියා අසා සිටියේ පන්තියේ තිබූ බිත්ති පුවත් පතට තම අවධානය යොමු කරමිනි.

**II කොටස** (පැය 02)

01. පහත සඳහන් විෂය සමගාමී ක්‍රියාකාරකම්වලින් ඔබ කැමති එක් ක්‍රියාකාරකමක් තෝරා එය පාසලට ගැලපෙන ලෙස සංවිධාන සැලැස්මක් සකස් කරන්න.

01. බිත්ති පුවත්පත

02. උදෑසන රැස්වීම

03. ක්‍රීඩා පුහුණුව

04. චිත්‍ර ප්‍රදර්ශන

ඇමුණුම 1

දේශකයා සඳහා

## 01. පළමු සැසිය

### ❖ විෂය සමගාමී නිර්වචන කිහිපයක්

i. විධිමත් විෂය මාලාව පෝෂණය කිරීම සඳහා පාසල් විසින් සැලැසුම් කර ක්‍රියාත්මක කරනු ලබන නිරන්තර අධීක්ෂණයට භාජනය කරනු ලබන ක්‍රියාකාරකම් සමූහයක එකතුවකි.

ii. විෂය සමගාමී ක්‍රියාකාරකම් මඟින් ශිෂ්‍යයන්ගේ දැනුම පමණක් නොව යහපත් ගති සිරිත්, යහපත් ආකල්ප, උසස් කුසලතා හා පෞරුෂ ලක්ෂණ වර්ධනයක් සිදු කරනු ලබයි.

iii. විෂය සමගාමී ක්‍රියාකාරකම් යනු,
සාම්ප්‍රදායානුකූල පන්ති කාමර ඉගැන්වීමේ ක්‍රියාකාරකම්වලින් එක්තරා ප්‍රමාණයකට වෙනස් වූ පරිපාලනමය නුඹුරුවකින් හා සංවිධානාත්මක ස්වරූපයකින් යුතු පාසල මඟින් ක්‍රියාත්මක කරනු ලබන සියළුම ක්‍රියාකාරකම්ය.

(Dictionary of Education New York -1997)

"අධ්‍යාපනයේ ප්‍රජනන කුසලතා සංවර්ධන අරමුණ සාක්ෂාත් කර ගත හැකි, ඒ හා සමගම බහු විධ ජන සම්මතවාදී සමාජයකට ගැළපෙන, ආධ්‍යාත්මික , සමාජයීය සංස්කෘතික හා දේශපාලනමය සාරධර්මද අතුළත්, වින්දන ක්ෂේත්‍රයන්හි අරමුණු ද සපුරා ගත හැකි මනාව සැලසුම් කළ විෂය සමගාමී ක්‍රියාකාරකම් හා අත්දැකීම් ආධාරිත වූ සමබර විෂය මාලාවක් පාසල්වල ක්‍රියාත්මක කළ යුතුය."

(කන්නන්ගර කමිටු වාර්තාව -1942)

### ❖ පාසලක සංවිධානය කළ හැකි විෂය සමගාමී ක්‍රියාකාරකම් කිහිපයක්

1. ක්‍රීඩා
   - අන්තර් නිවාස ක්‍රීඩා තරඟ
   - වොලිබෝල්
   - පාපන්දු
   - දැල් පන්දු , ක්‍රිකට්
   - හොකී, චෙස්, කැරම්
   - එල්ලේ, පැසි පන්දු

2. ශිෂ්‍ය සංගම්
   - සාහිත්‍ය සංගම්
   - විද්‍යා සංගම්
   - ගණිත සංගම්
   - බෞද්ධ සංගම්
   - දැනුම මිනුම සංගම්

3. ආගමික වැඩ සටහන් - ශීල ව්‍යාපාර
- ධර්ම දේශනා
- භක්ති ගීත
- වෙසක් උත්සව
- පොසොන් උත්සව

4. උදෑසන රැස්වීම - විශේෂ උදෑසන රැස්වීම
- අංශ මට්ටමේ රැස්වීම්
- පන්ති මට්ටමේ රැස්වීම්

5. සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් - විවිධ ප්‍රසංග
- චිත්‍ර ප්‍රදර්ශන
- නාට්‍ය ප්‍රසංග
- නූර්ති ගී ප්‍රසංග
- කලා උළෙල

6. ශිෂ්‍ය සුභසාධනය - සෞඛ්‍යදාන
- රතු කුරුස
- ප්‍රථමාධාර
- කොළ කැඳ ව්‍යාපෘති

7. බාලදක්ෂ/පෝතක, බාලදක්ෂිකා/ කුඩා මිතුරී
8. බිත්ති පුවත්පත්
9. ව්‍යාපෘති - අධ්‍යාපන චාරිකා
- ක්ෂේත්‍ර චාරිකා
- ශ්‍රමදාන

## ❖ විෂය සමගාමී වර්ගී කරනය

a. පාසල තුළ පමණක් - උදෑසන රැස්වීම
- ශිෂ්‍ය සමිති
- සභරා
- බිත්ති පුවත්පත්
- ප්‍රථමාධාර ඒකක
- භාෂා දින
- ප්‍රදර්ශන

b. පාසල හා ප්‍රජාව - ශ්‍රමදාන, ආගමික උත්සව
- පෝෂණ වැඩසටහන්
- ශීල ව්‍යාපාර
- ක්‍රීඩා කටයුතු
- ත්‍යාග ප්‍රදානෝත්සව
- සෞඛ්‍ය වැඩ සංගම්

c. පාසල හා රජයේ ආයතන සම්බන්ධ - පාසල් සෞඛ්‍ය වැඩසටහන් (molt)
- පරිසර (මධ්‍යම පරිසර අධිකාරිය)
- මාර්ග ආරක්ෂාව (Police)
- දැණුම මිනුම තරහ (බැංකුව)
- රූපවාහිනී හා ගුවන් විදුලි වැඩසටහන්

d. පාසල හා රජයේ නොවන - මත්ද්‍රව්‍ය නිවාරනය (ADIC සෞඛ්‍ය අමාත්‍යාංශය)
- පරිසර වැඩසටහන් (World Vision)

**විෂය සමගාමී වැඩසටහන් පාසල් තුළ ක්‍රියාත්මක වීම තුළින් බලාපොරොත්තු වන ආකල්ප හා කුසලතා.**

ආකල්ප -

1. ජාතියට පාසලට ආගමට භක්තිය හා ගෞරවය දැක්වීම.
2. ක්‍රමවත් බව, ක්‍රමානුකූල බව, නීති ගරුක බව හා විනය ගරුක බව.
3. ඉවසීම, ජය පරාජය සතුටින් බාර ගැනීම.
4. අන්‍ය මත ඉවසීම, සංවේදී බව මානව දයාව වර්ධනය.
5. අභියෝගවලට නොබියට මුහුණ දීම.
6. ධෛර්යවන්ත බව.
7. පොදු දේපළ ආරක්ෂාව.
8. පරිසරයට හිතකාමී බව
9. වින්දනාත්මක බව
10. සංවර බව
11. කරුණාවන්තකම වර්ධනය

කුසලතා

1. සංවිධානාත්මක ශක්තිය වර්ධනය
2. ඉදිරිපත්වීමේ කුසලතා
3. සන්නිවේදන කුසලතා
4. කථිකත්වය
5. බුද්ධි වර්ධනය
6. නර්තන හැකියාව
7. රැස්වීම් සැලසුම් කිරීම
8. නිර්මාණ කරණ